මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.02. 09

චක්‍රලේඛ අංකය : DFD/ 2023-1

ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
සියලුම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්

## 2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ සහ වී තොග බැහැර කිරීමේ වැඩසටහන

## දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් මඟින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති හරහා වී මිලදී ගැනීම සහ වී තොග සහල් කිරීම

2022/2023 මහ කන්නයේ වී අස්වැන්න සඳහා ගොවීන්ට සාධාරණ මිලක් ලබාදීමත් අතිරික්තය රජය විසින් මිලදී ගැනීමත්, පවතින දුෂ්කර ආර්ථික තත්ත්වය හමුවේ පීඩාවට පත්ව සිටින අඩු ආදායම්ලාභී පවුල් වෙත සහන සැලසීමත් අරමුණු කරගෙන '2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන' යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක 23/0097/601/007 හා 2023.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදෙන ලද 2023.01.16 දිනැති තීරණය පරිදි 2022/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ඇත. ඒ අනුව, වී මිලදී ගැනීමේ හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන් පහත දක්වා ඇති උපදෙස් පරිදි ක්‍රියාත්මක කළ යුතුය.

### 2.0 වී මිලදී ගැනීමේ වැඩසටහන

2022/23 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති හරහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් **නාඩු වී පමණක්** මිලදී ගැනීමට නියමිතය. වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය තුළ තම දිස්ත්‍රික්කයේ සිටින වී තොග මිලදී ගැනීමේ, ගබඩා කිරීමේ සහ සහල් කිරීමේ ධාරිතාවය සහිත සුදුසු සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති සමඟ ගිවිසුම්ගතව ඔවුන් හරහා ගොවීන්ගෙන් වී මිලදී ගැනීම, ඊට අදාළ ලේඛණ පවත්වාගෙන යාම සහ ගිණුම්ගත කිරීමේ වගකීම දිස්ත්‍රික් ලේකම්/දිසාපති හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරේ.

### 2.1 අරමුදල් සම්පාදනය

දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති හරහා ක්‍රියාත්මක කරන රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන ආරම්භ කිරීම සඳහා වන අරමුදල් අවශ්‍යතාවය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු අතර ඒ අනුව, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ඍජුවම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් වෙත භාණ්ඩාගාර අරමුදල් වෙන්කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවටත් අක්මුදල් නිදහස් කිරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවටත් උපදෙස් ලබා දෙනු ඇත. ඒ අනුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව අදාළ දිස්ත්‍රික්

ලේකම්/දිසාපතිවරුන් වෙත සෘජුවම අයවැය ප්‍රතිපාදන ලබාදෙනු ඇති අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් වෙත වී මිලදී ගැනීම සඳහා අක්මුදල් නිදහස් කරනු ඇත.

වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා වන අරමුදල්, අවශ්‍යතාවය පරිදි මහා භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කිරීම සිදු කරන අතර, එම අරමුදල්වල ඉතිරිව පවතින ශේෂයන් වී මිලදී ගැනීමේ කටයුතු නිමකළ වහාම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඇති නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුම වෙත පියවා, ඒ සම්බන්ධයෙන් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතුය.

**2.2. 2022/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ සහතික මිල**

උපරිම තෙතමනය 14%ක් සහ උපරිම බොල් ප්‍රමාණය 9%ක් වන වී නිසි ප්‍රමිතියෙන් යුතු වී වන අතර, තෙතමනය 14% ඉක්මවන 22% ක හෝ ඊට අඩු වී තෙත වී ලෙස සැළකේ. එම ප්‍රමිතීන්ට අනුව වී තොග පහත මිල ගණන් යටතේ මිලට ගත යුතුය.

| | | |
|---|---|---|
| I. | උපරිම තෙතමනය 14%ක් සහ උපරිම බොල් ප්‍රමාණය 9%ක් වන නිසි ප්‍රමිතියෙන් යුතු <u>නාඩු වී</u> කිලෝ ග්‍රෑම් 01 ක් | - රු. 100.00 |
| II. | තෙතමනය 14% ඉක්මවන හා 22% හෝ ඊට වඩා අඩු <u>නාඩු වී</u> කිලෝ ග්‍රෑම් 01ක් | - රු. 88.00 |

**2.3. වී තොග මිලදීගැනීම, තෙතමනය සහිත වී වියළීම සහ වී තොග ගබඩාකර තැබීම**

වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය තුළ තොග භාර ගැනීම, ගබඩා කිරීම සහ ඊට අදාළ ලේඛණ පවත්වා ගැනීම හා ගිණුම් ගත කිරීම පිළිබඳ වගකීම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් සහ අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරේ.

2.3.1 දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති හරහා ඉහත 2.2 හි දක්වා ඇති මිල ගණන් යටතේ වී මිලට ගත යුතුය. එහිදී, අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් වී මිලදීගැනීමේ ධාරිතාවය, ගබඩා කිරීමේ සහ සහල් කිරීමේ හැකියාව සහිත සුදුසු සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති වැඩසටහනට සම්බන්ධ කරගත යුතු අතර ඔවුන් සමග වී මිලදීගැනීම සහ බැහැර කිරීම සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹිය යුතුය. මේ සඳහා නීත්‍යානුකූලභාවය තහවුරු වන පරිදි සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති සමඟ ගිවිසුම්ගතවීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් කටයුතු කළ යුතුය.

මීට පෙර කන්නවල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් මඟින් ක්‍රියාත්මක කළ වී මිලදී ගැනීමේ වැඩසටහන් සඳහා සම්බන්ධ වූ වී මෝල්හිමියන්/සමුපකාර සමිති 2022/23 මහ කන්නයේ වී මිලදී ගැනීම සඳහා සහභාගිවීමට අපේක්ෂා කරන්නේ නම්, එම කන්නවලදී මිලදී ගත් වී තොග සියල්ලම සහල් කර මේ වන විට භාරදී තිබිය යුතුය. එසේම, මීට පෙර කන්නවලදී වී මිලදී ගැනීමේ වැඩසටහන්වලට සහභාගීවී නියමිත සහල් තොග මේවනතෙක් භාරනොදුන්, මෙම චක්‍රලේඛයට අමුණා ඇති අම්පාර, ත්‍රිකුණාමලය, පොළොන්නරුව හා පුත්තලම දිස්ත්‍රික්කවල, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති විසින් එම හිඟ සහල් තොග ලබාදී අවසන් වූ දින සිට පමණක් මෙම වැඩසටහන සඳහා සහභාගී කරගැනීමට අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් කටයුතු කළ යුතුය.

2.3.2 මිලදී ගන්නා වී තොග කඩිනමින් සහල් කර 2023 මාර්තු හා අප්‍රේල් මාස තුළදී බෙදා හැරීමට සැලසුම් කර ඇති බැවින් ඒ සඳහා වී කොටා අවසන් කළ හැකි වන පරිදි සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිතිවල වී කෙටීමේ ධාරිතාවය සලකා බලා වී මිලදී ගැනීමට අවශ්‍ය මුදල් එම වී මෝල්හිමියන්/සමුපකාර සමිතිවලට ලබා දිය යුතුය. අරමුදල් ඉල්ලීම් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන අවස්ථාවේ තම දිස්ත්‍රික්කයෙහි වී මිලදී ගැනීමට එකඟවූ වී මෝල්හිමියන්/සමුපකාර

සමිති ගණන, වෙන් වෙන් වශයෙන් ඔවුන්ගේ වී කෙටීමේ හා ගබඩා කිරීමේ ධාරිතාවය සහ මිලදී ගැනීමට අපේක්ෂිත ප්‍රමාණය ආදිය **(ඇමුණුම 01)** සහිතව ඉදිරිපත් කළ යුතුය.

2.3.3 තම දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් පමණක් වී මිලදීගන්නා බවට සියලුම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් වගබලාගත යුතුය. එම ගොවීන්ගෙන් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති විසින් මිලදී ගන්නා වී තොග සඳහා අදාළ ගොවියා නමින් වටිනාකම සඳහන් ගෙවීමේ සහතික පත්‍රයක් දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන අතර එම ගෙවීමේ සහතික පත්‍රය සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති සහ දිස්ත්‍රික් ලේකම්වරයා/ප්‍රාදේශීය ලේකම්වරයා විසින් බලය පවරනු ලබන නිලධාරියෙක් ලෙස නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතුය.

අදාළ ගොවියා නමින් නිකුත් කරනු ලබන ගෙවීමේ සහතික පත්‍රය, ලංකා බැංකුව, මහජන බැංකුව හෝ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අදාළ ශාඛාවට ඉදිරිපත් කළ විට අදාළ බැංකුව විසින් එම ගොවියාගේ බැංකු ගිණුමට නියමිත මුදල වහාම බැර කරනු ලැබේ.

2.3.4 වී මිලදී ගන්නා ප්‍රදේශවල පිහිටුවා ඇති ලංකා බැංකුව, මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන බැංකුවලට අයත් ශාඛා, දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ සේවා අවශ්‍යතාවය මත සති අන්තවලද විවෘත කර තැබිය යුතුය.

2.3.5 නිසි ප්‍රමිතියට අනුකූල නොවන නමුත් තෙතමනය 14% වඩා වැඩි හා තෙතමනය 22% හෝ ඊට වඩා අඩු වී මිලදී ගැනීමේදී, වී නිසි ප්‍රමිතියට වියළා ගැනීමට සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්/සමුපකාර සමිති දායක කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කළ යුතුය. මෙහිදී, නිසි ප්‍රමිතියට වී වියළීම සඳහා වැයවන වියදම වෙනුවෙන් වී කිලෝග්‍රෑම් එකකට රු.4.50ක උපරිම මුදලක් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති සඳහා ගෙවනු ලැබේ. තෙතමනය 14% ඉක්මවන හා 22% හෝ ඊට වඩා අඩු වී මිලදී ගෙන වියළා ගැනීමේදී බර අඩුවීමේ උපරිම අගය 12.5%කි. එනම්, එම තෙත වී වියළාගැනීමේ ක්‍රියාවලියේදී වී තොග අඩුවීමේ උපරිම හැකියාව තෙත වී කිලෝග්‍රෑම් 100 කට කිලෝග්රෑම් 12.5කි.

ඒ අනුව, දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් විසින් බලය පවරන නිලධාරියකු විසින් වී මිලදීගැනීමේ දී හා වියළාගැනීමේදී පවතින අදාළ බර ප්‍රමාණය හා තෙතමන අගයන් එක් එක් තොග සඳහා වෙන වෙනම සටහන් කර වාර්තා පවත්වාගත යුතුය.

2.3.6 වී ඇසුරුම් මලු සඳහා වන පිරිවැය ආවරණය වන පරිදි වී කෙටුම්කුලිය තීරණය කර ඇති බැවින් වී ඇසුරුම් මලු සඳහා අමතර මුදලක් ගෙවනු නොලැබේ. වී මෝල්හිමියන්/සමුපකාර සමිති තමා විසින් මිලදී ගන්නා සුදුසු තත්ත්වයේ ඇසුරුම් මලු වී ඇසිරීම සඳහා භාවිතා කළ හැකිය.

2.3.7 වගා කර ඇති භූමි ප්‍රමාණය අනුව එක් ගොවියෙකුගෙන් මිලදී ගත හැකි උපරිම වී ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| වගා කර ඇති බිම් ප්‍රමාණය | මිලදී ගන්නා උපරිම වී ප්‍රමාණය (කිලෝග්‍රෑම් ) |
|---|---|
| අක්කර 1 දක්වා | 2,000 |
| අක්කර 1-2 දක්වා | 4,000 |
| අක්කර 2 ට වැඩි | 5,000 |

2.3.8 සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති 2022/23 මහ කන්නයේ මෙම වැඩසටහන යටතේ මිලදී ගන්නා වී තොග ඔවුන් පුද්ගලිකව මිලදී ගන්නා වී තොග වලින් වෙන් කර ගබඩා කර තැබීමට පහසුකම් තිබිය යුතු අතර එම වී තොග වෙන් වෙන්ව ගබඩා කර ඇති බව තහවුරු කර ගැනීමට දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අවශ්‍ය පියවර ගත යුතුය. එසේම, ඔහු විසින් බලය පවරන නිලධාරින් විසින් එම වී සහල් කරන අවස්ථාව තෙක් නියමිත වී තොග පවත්වාගන්නේද යන්න පිළිබඳවද තහවුරු කරගත යුතුය.

2.3.9 මෙම වැඩසටහන සඳහා අවශ්‍ය වන තෙතමන මැණුම් මාපක සහ තරාදි වැනි මූලික අවශ්‍යතා අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් කළමනාකරණය කරගත යුතුය. වැඩසටහන සම්බන්ධව අවශ්‍ය වන ප්‍රවාහන කටයුතු සඳහා රාජ්‍ය ආයතන සතුව පවතින ලොරි සහ ට්‍රක් රථ අවශ්‍යතාවය මත යොදා ගැනීමට කටයුතු කළ යුතුය.

**3.0 වී තොග බැහැර කිරීමේ වැඩසටහන - සහල් නිෂ්පාදනය**

උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2022/23 මහ කන්නයේදී මිලදීගනු ලබන වී තොග සහල් කර හඳුනාගත් අඩු ආදායම්ලාභී පවුල් ආවරණය වන පරිදි එක් පවුලකට මාසයකට කිලෝග්‍රෑම් 10ක් බැගින් මාස දෙකක කාලයක් සඳහා බෙදාදීමට නියමිතව ඇති අතර ඊට අදාළ උපදෙස් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් ලබාදෙනු ඇත.

**3.1 වී තොග සහල් කිරීමේ ක්‍රමවේදය**

3.1.1 කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් ලබාදෙන උපදෙස් පරිදි අවශ්‍ය සහල් තොග අදාළ දිනට ලබාදීම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්ගේ වගකීම වේ. ඒ සඳහා වී තොග කෙටීම සහ සහල් ලබාදීම සම්බන්ධයෙන් (සැපයීම කළ යුතු දිනය, ප්‍රමාණය, ප්‍රවාහනය කළ යුතු ස්ථානය ආදිය) අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්/ සමුපකාර සමිති වෙත උපදෙස් ලබාදිය යුතුය.

3.1.2 වී තොග සහල් කිරීමේදී, උසස් තත්ත්වයේ සහල් නියමිත වේලාවට ලබාදිය හැකිවන පරිදි මෙන්ම සහල් බෙදාහැරීමේ වැඩසටහනට බාධාවක් නොවන පරිදි වී මෝල්වල සම්පූර්ණ ධාරිතාවයෙන් මෙම වැඩසටහනට අදාළ සහල් කෙටීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකරන බවට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් වගබලාගත යුතුය.

3.1.3 **වී කෙටුම්කුලී, සහල් ඇසුරුම් මලුවල මිල ගණන්, ප්‍රවාහන වියදම හා වී සහල් බවට පරිවර්තන කිරීමේ අනුපාතය**

- වී තොග සහල් කිරීමේදී අදාළ කරගතයුතු ගාස්තු පහත පරිදි වේ.
  - **වී කෙටුම්කුලිය**

| අංකය | සහල් වර්ගය | ලබාදෙන උපරිම පිරිවැය (වී කිලෝවක් සඳහා රු.) |
|---|---|---|
| 1 | සුදු නාඩු (තම්බන ලද) | 9.50 |
| 2 | රතු නාඩු (තම්බන ලද) | 9.50 |
| 3 | සුදු කැකුළු | 7.00 |
| 4 | රතු කැකුළු | 7.00 |

  - **සහල්වල ප්‍රවාහන වියදම**
    සහල් තොග ප්‍රවාහනයේදී කිලෝමීටර 200ක් (යාමට හා ඒමට ඇතුළත්ව) සඳහා ප්‍රවාහන ගාස්තු වී කෙටුම් කුලිය තුළ අඩංගු කර ඇත.

  - සහල් ඇසුරුම් මලු ගාස්තු කිලෝග්‍රෑමයක් සඳහා උපරිම මිල රු. 5.00කි. ඒ අනුව, කිලෝග්‍රෑම් 10 බෑගයක් සඳහා ලබාදිය හැකි උපරිම මිල රු. 50කි.

- 2022/23 මහා කන්නයේ මිලදී ගනු ලබන වී සහල් කිරීමේදී ලබාදිය යුතු සහල් අනුපාතය 65% කි.

## 3.2 සහල් තොග ඇසුරුම් කිරීම, ගබඩා කිරීම සහ භාරගැනීම

3.2.1 නිෂ්පාදනය කරන සහල් තොග කිලෝග්‍රෑම් 10 බැගින් ඇසුරුම් මලුවල අසුරාලීමට සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති කටයුතු කළ යුතුය. අනතුරුව ඒවා නිසිපරිදි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්ගේ අධීක්ෂණය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ට/සමුපකාර සමිතිවලට අයත් ගබඩාවල ආරක්ෂිතව ගබඩා කර තබා, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මඟින් ලබාදෙන උපදෙස් අනුව සහල් බෙදාදීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් එම සහල් තොග සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති වෙතින් භාරගත යුතුය. එසේ භාරගත් බවට අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් තොග ලැබීමේ නිවේදනය (GRN) සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති වෙත නිකුත්කළ යුතු අතර එම නිවේදනයේ පිටපතක් දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් සුරක්ෂිතව තබාගත යුතුය.

3.2.2 ඉහත පරිදි සහල් තොග අදාළ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිතිවලින් භාරගැනීමෙන් පසුව එම සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති වෙත කෙටුම් කුලිය, ඇසුරුම් ගාස්තු ඇතුළු අදාළ ගෙවීම් මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව පමණක් සිදුකිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් කටයුතු කළ යුතුය.

3.2.3 සහල් තොග භාර ගැනීම, ගබඩා කර තැබීම හා තම දිස්ත්‍රික්කය තුළ සහ වෙනත් දිස්ත්‍රික්කවල අඩු ආදායම්ලාභී පවුල් වෙත බෙදාහැරීමට සපයන ලද සහල් තොග පිළිබඳ විස්තරාත්මක වාර්තා අදාළ ආයතනවලට පසුවිපරම සඳහා ලබාදිය හැකි වන පරිදි තබාගැනීම හා ගිණුම්ගත කිරීම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් කළ යුතුය.

3.2.4 ඉහත 2.3.1 යටතේ අත්සන් කරනු ලබන ගිවිසුම්වලට අනුකූලව නියමිත සහල් තොග ලබා නොදෙන සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති සම්බන්ධයෙන් එම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපති/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් පියවර ගත යුතුය.

## 4.0 අනෙකුත් කරුණු

වී මිලදී ගැනීමේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් පහත පියවර ද ගත යුතුය.

4.1 ගබඩාවල පවතින වී සහ සහල් තොග ආරක්ෂාව සඳහා අවශ්‍යතාවය මත සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යොදවා ගැනීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් කටයුතු කළ යුතුය.

4.2 වී මිලදී ගැනීමේදී වන මෙහෙයුම් වියදම් අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ අනුමැතීන්ට යටත්ව සිදුකිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් පියවර ගත යුතුය.

4.3 එක් එක් දිස්ත්‍රික්කයේ වී මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මාණ්ඩලික නිලධාරියකු පත්කළ යුතු අතර ඔහුගේ විස්තර මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබාදිය යුතුය.

4.4 වී මිලදී ගැනීමේ හා අරමුදල් භාවිතා කිරීමේ දෛනික ප්‍රගතිය ඇමුණුම **02** පරිදි ද වී තොග සහල් කිරීම සහ සහල් තොග භාර ගැනීම පිළිබඳ ප්‍රගතිය ඇමුණුම **03** පරිදි ද සකස්කර මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය.

4.5 වී මිලදී ගැනීම සහ වී තොග සහල් කිරීම අවසන් වූ දිනට පසුව අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මිලදී ගත් වී තොග සහ භාවිතා වූ අරමුදල්වල විස්තරාත්මක සටහනක් දිස්ත්‍රික් ලේකම්/දිසාපතිගේ අත්සනින් යුතුව මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවට

ලබාදිය යුතුය. අදාළ අකෘතිපත්‍ර සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී ලබාදීමට කටයුතු කරනු ඇත.

4.6 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ජාතික ප්‍රමුඛතාවයක් සේ සළකා රජයේ වියදම අවම වන පරිදි අස්වනු නෙළන කාලය තුළ සමස්ත රාජ්‍ය සේවය කැපවීමෙන් ආදර්ශමත්ව කටයුතු කළ යුතුව ඇත.

වී මිලදී ගැනීමේ හා වී තොග සහල් කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවෙන් සම්බන්ධ කර ගතයුතු නිලධාරින්ගේ විස්තර පහත දැක්වේ.

| නම | තනතුර | දුරකතන අංකය | විද්‍යුත් තැපැල |
|---|---|---|---|
| ගීතා විමලවීර මෙනවිය | අධ්‍යක්ෂ ජනරාල් | 011 - 2484542 | dgdf@dfd.treasury.gov.lk |
| එස්.හේමන්ත විජිත කුමාර මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 011 - 2484595<br>071 - 5349063 | kumara.shv@dfd.treasury.gov.lk |
| ඩබ්.ඒ.එන්. තුෂාරි මිය | අධ්‍යක්ෂ | 011 - 2484596<br>071 - 5341937 | thushari.wan@dfd.treasury.gov.lk<br>dfdmofdata2015@gmail.com |

කේ.එම්.මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු.දැ.ගැ.ස.
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස සහ අ.ක.ස.
4. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
5. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
6. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
7. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු.දැ.ගැ.ස.
8. සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
9. සාමාන්‍යාධිකාරී, මහජන බැංකුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
10. සාමාන්‍යාධිකාරී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.

ඇමුණුම 01

## 2022/23 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ හා බැහැර කිරීමේ වැඩසටහන් සඳහා සහභාගීවීමට අපේක්ෂිත

## සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ගේ නාම ලේඛණය

දිස්ත්‍රික්කය : ......................................................

| # | සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | වී මෝලෙහි නම හා ලිපිනය | පසුගිය කන්නවලට අදාළ හිඟ සහල් තොග භාරදීමට තිබේද? (ඔව්/නැත) | දෛනික වී කෙටීමේ ධාරිතාවය (මෙ.ටො) | මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය (කි.ග්‍රෑ) |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| .... | | | | | | |
| .... | | | | | | |
| එකතුව | | | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.............................
සකස් කලේ

නම :
තනතුර :
දිනය :

.............................
පරීක්ෂා කලේ

නම :
තනතුර :
දිනය :

.............................
අනුමත කලේ

නම :
තනතුර :
දිනය :

සම්බන්ධීකරණ නිලධාරියාගේ නම :
තනතුර :
දුරකථන අංකය (කාර්යාලීය/පෞද්ගලික) :

ඇමුණුම 02

## 2022/23 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ හා බැහැර කිරීමේ වැඩසටහන

## ............. දිනට මිලදී ගන්නා ලද වී තොග පිළිබඳ වාර්තාව

දිස්ත්‍රික්කය : ........................................................

මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල : රු.................................................

| මිලදී ගත් වී ප්‍රමාණය (කි.ග්‍රෑ) | | | | | | |
|---|---|---|---|---|---|---|
| සම්මත වී (උපරිම තෙතමනය 14 %) | | | තෙත වී (තෙතමනය 14%ට වැඩි 22% හෝ ඊට අඩු) | | | මුළු මිලදී ගැනීම |
| සුදු නාඩු | රතු නාඩු | එකතුව | සුදු නාඩු | රතු නාඩු | එකතුව | |
| (1) | (2) | (3) = (1)+(2) | (4) | (5) | (6)= (4)+(5) | (7)=(3)+(6) |
| | | | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

| ............................ | ............................ | ............................ |
|---|---|---|
| සකස් කලේ | පරීක්ෂා කලේ | අනුමත කලේ |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | තනතුර : |
| දිනය : | දිනය : | දිනය : |

සම්බන්ධීකරණ නිලධාරියාගේ නම :

තනතුර :

දුරකථන අංකය (කාර්යාලීය/පෞද්ගලික) :

## රජයේ වී තොග බැහැර කිරීමේ වැඩසටහන - 2022/23 මහ කන්නය

## ........................... දිනට භාර දෙන ලද සහල් තොග පිළිබඳ වාර්තාව

දිස්ත්‍රික්කය : ........................................................

| # | (1) | (2) | | | (3) | | | (4) | | | 5 = ((2) + (4)) | | | (6) | | | (7) | | | | | (8)' |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී මෝල්හිමියාගේ නම | මිලදී ගෙන ගබඩා කර තිබූ ප්‍රමිතිගත (තෙතමනය 14%) වී ප්‍රමාණය (කි.ග්‍රෑ) | | | මිලදී ගෙන ගබඩා කර තිබූ තෙත (14% - 22%) වී ප්‍රමාණය (කි.ග්‍රෑ) | | | | | | ගබඩා කරන ලද මුළු වී ප්‍රමාණය | | | නිපදවිය හැකි සහල් ප්‍රමාණය (මෙ.ටො) | | | දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත භාරදෙන ලද සහල් ප්‍රමාණය (මෙ.ටො ) | | | | | කි.ග්‍රෑ. 10 මලු ප්‍රමාණය |
| | | | | | වියළීමට පෙර | | | වියළීමෙන් පසු | | | | | | | | | | | | | | |
| | | කීරි නාඩු | රතු නාඩු | එකතුව | කීරි නාඩු | රතු නාඩු | එකතුව | කීරි නාඩු | රතු නාඩු | එකතුව | කීරි නාඩු | රතු නාඩු | එකතුව | කීරි නාඩු | රතු නාඩු | එකතුව | සම්බා කීරි නාඩු | කීරි කැකුළු | සම්බා රතු නාඩු | රතු කැකුළු | එකතුව | |
| 1 | | | | | | | | | | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | | | | | | | | | | | |
| .... | | | | | | | | | | | | | | | | | | | | | | |
| .... | | | | | | | | | | | | | | | | | | | | | | |
| .... | | | | | | | | | | | | | | | | | | | | | | |
| .... | | | | | | | | | | | | | | | | | | | | | | |
| .... | එකතුව | | | | | | | | | | | | | | | | | | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

| ........................... | ........................... | ........................... |
|---|---|---|
| සකස් කලේ | පරීක්ෂා කලේ | අනුමත කලේ |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | තනතුර : |
| දිනය : | දිනය : | දිනය : |

සම්බන්ධීකරණ නිලධාරියාගේ නම :
තනතුර :
දුරකථන අංකය (කාර්යාලීය/පෞද්ගලික) :